www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වධ බන්ධන, පොලිස් ඝාතන සහ ඇමරිකාව මිලිටරීකරනය වීම

## Torture, police killings and the militarization of America

**2014 දෙසැම්බර් 12**

සීඅයිඒ වධදීම් හෙලිදරව් කෙරෙන රහස් පරීක්ෂන පිලිබඳ සෙනේට් සභාවේ පරීක්ෂන වාර්තාව ඇමරිකාව තුල ප්‍රසිද්ධ කිරීම සිදු වූයේ, ඇමරිකාව තුල ම අති දරුනු වූත් දඬුවම් නො ලද්දා වූත් පොලිස් මිනීමැරුම් මාලාවකට එරෙහිව කෝපාවිෂ්ඨ විරෝධතා මාලාවක් රට පුරා පැතිර යන අවස්ථාවක දී ය යන්න ඇමරිකානු ජනමාධ්‍යවල අවධානයට ලක් වූයේ ඉතාමත් ම අඩුවෙනි.

එකිනෙකට සම්බන්ධයක් නැති කථා ලෙස සලකනු ලැබ ඇත්තේ ඇත්ත වශයෙන් ම එක ම සිදුවීමක පැති දෙකකි: එනම්, දන්ඩ මුක්තික අපරාධකාරී පොලිස් රාජ්‍ය යාන්ත්‍රනයක් විශාල ලෙස වර්ධනය වීමයි. විදේශයන්හි කරන්නා වූ අපරාධවලත් රට තුල කරන්නා වූ අපරාධ තුලත් ඇත්තේ එක ම මූලයකි: එය නම්, ගැඹුරුතම අර්බුදයක ගිලී ඇත්තා වූත් සමාජ අසමානත්වය, මිලිටරිවාදය සහ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට නො නවත්වා පහර දීම තමා ගේ මූලික ලක්ෂනය කර ගන්නා වූත් ආර්ථික සහ සමාජ ක්‍රමයකි.

මිසූරි ප්‍රාන්තයේ පර්ගසන් නුවර දී මයිකල් බ්‍රවුන් නම් තරුනයා වෙඩි තබා මරා දැමුවා වූත් නිව්යෝර්ක් නාගරික ප්‍රදේශයක් වන ස්ටාටෙන් දූපතේ දී එරික් ගාර්නර් ගේ බෙල්ල මිරිකා මරා දැමුවා වූත් ක්ලිව්ලන්ඩ්, ෆීනික්ස් සහ තවත් ස්ථානවල දී ආරක්ෂාවක් නොමැති නිරායුධ පුද්ගලයින් මරා දැමුවාවූත් පොලිස් භටයින් දඬුවම් නො ලබා ගැලවී යන්නේ තම අපරාධවලට හේතු දක්වීම සඳහා කිසිදාක නො කැඳවෙන ලෙස මහා ජූරිය ඇමරිකාවේ උසාවි ක්‍රමයක් විසින් නිදහස් කර යැවීමේ විධි ක්‍රමයක් ආන්ඩුවේ නීතිඥයින් විසින් අනුගමනය කිරීම මගිනි.

සීඅයිඒ මිනීමරුවන් සහ වධකයින්ට අමතරව ඇමරිකන් නීතිය පමනක් නොව ජාත්‍යන්තර නීතිය ද උල්ලංඝනය කරමින් දූෂිත බවේ සහ ප්‍රචන්ඩත්වයේ පද්ධතියකට අනුමැතිය දුන්නා වූත් එය අධීක්ෂනය කලා වූත් ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්, ඩික් චෙනී, ජෝර්ජ් ටෙනෙට්, කොන්ඩොලිසා රයිස් සහ අනෙක් ප්‍රධාන නිලධාරීන් වහාම අත් අඩංගුවට ගෙන ඔවුන්ට නඩු පැවරීම සඳහා සෙනේට් වාර්තාවේ ක්‍රියා ප්‍රමානවත් වෙයි.

එහෙත් එසේ නඩු පැවරීමට යන්තම් හෝ ඉඩක් ඇත්තේ යැයි ඇමරිකන් කොන්ග්‍රසයේ හෝ ඔබාමා පරිපාලනයේ හෝ ඇමරිකන් පාලක ස්ථාපිතයේ වෙන අංශයක් හෝ අඟවන්නේ නැත. අපරාධ ගැන තමා මත් වගකිව යුතු බව ඇඟවූම් කෙරී ඇති ඔබාමා ගේ සීඅයිඒ අධ්‍යක්ෂ වන ජෝන් බ්‍රිනන් 11දා ලැන්ග්ලි නුවර පිහිටි සීඅයිඒ මූලස්ථානයේ හදිසි මාධ්‍ය හමුවක් පැවැත්වූයේ, "උග්‍ර කරන ලද ප්‍රශ්න කිරීම්" යනුවෙන් හඳුන් වන වධ දීමේ ක්‍රියාමාර්ගය ආරක්ෂා කිරීමට සහ සෙනේට් වාර්තාව හෙලා දැකීමට ය.

2002 වසරේ දී සීඅයිඒ සංවිධානයේ ත්‍රස්ත මර්දන මධ්‍යස්ථානයේ හිටපු අධ්‍යක්ෂ කෝෆර් බ්ලැක්, තමා ගේ වදන්වලට අනුමැතිය දක්වන්නා වූ කොන්ග්‍රස් කමිටුවක් අමතමින් "9/11ට පස්සේ අපි අත්මේස් ගැලෙව්වා" යනුවෙන් ප්‍රකාශ කලේ ය. අතින් පයින් පහර දෙන ගුටිකෙලියක චිත්ත රූපය මවන්නා වූ මෙම ප්‍රකාශය, බුෂ් ගේ ධවල මන්දිරය තුලත් ඇමරිකාවේ මිලිටරි නායකත්වය තුලත් ජනප්‍රිය කියමනක් බවට පත් විය. එය, "වෝටර් බෝඩිං" (දියේ ගිලී හුස්ම හිරවන බව දැනෙන පරිදි මුහුනට ජලය දැමීම), පුද්ගලයින් මාංචුවලින් එල්ලීම සහ අධෝමාර්ගීය විජලනය දක්වා වඩාත් බිහිසුනු වූ ප්‍රචන්ඩ ක්‍රියා බවට පරිවර්තනය කරන ලදී.

එහෙත් "අත්මේස්" ගැලවීමේ ඊටත් වඩා දුරදිග යන ඇඟවූම් පැවතුනි. එයින් සිදු කෙරුනේ ඇමරිකන් ආන්ඩු ක්‍රමයට ජීනීවා ප්‍රඥප්තියට සහ අභ්‍යන්තර සහ ජාත්‍යන්තර නීතිවලට තිබූ බැඳීම් සියල්ල ම අහෝසි කිරීමයි. අත්මේස් ඉවත් කෙරුනේ ගුවන්තනාමෝ, අබුග්‍රයිබ්, බග්‍රම් සහ ලෝ පුරා පැතිර තිබූ අනෙකුත් සීඅයිඒ කලුකඳවුරුවල ප්‍රශ්නකරුවන් ගේ පමනක් නොවේ. ප්‍රාදේශීය පොලිසිවල සිට රාජ්‍යයේ සෑම මට්ටමකම ද අත්මේස් ගලවා දමනු ලැබ ඇත.

වධ දීම් "අපේ සාරධර්මවලට විරුද්ධ" යැයි ඔබාමා අද කෙසේ කීවත් ඔහුගේ ජනාධිපති ධූර කාලය තුල මෙම ක්‍රියාදාමය ගුනාත්මක ව ගැඹුරු වී ඇත. ඇමරිකානු පුරවැසියන් සතුරු ත්‍රස්තවාදීන් ලෙස හංවඩු ගසා ඔවුන් ඩ්‍රෝන් යානා වලින් ඝාතනය කිරීමේ බලය තමන් වෙත පවරා ගැනීමට ඔබාමා මහතා ගේ "සාරධර්ම" ඔහුට ඉඩ දෙයි. ඕනෑ ම ඇමරිකන් හෝ විදේශ ජාතිකයෙක් යුද වැදී සිටින සතුරු භටයෙක් යැයි නම් කර චෝදනා ඉදිරිපත් නො කර හෝ නඩු නො අසා අවිනිශ්චිත කාලයක් සිරකර

තබා ගැනීමට ඔහුට ඇත්තේ යැයි පැවසෙන අයිතිය නීතිගත කිරීමට එම සාරධර්ම ඔහුට ඉඩ දෙයි. ලොව පුරා සිටින්නා වූ අහිංසක ජනයා ගේ සංනිවේදන මාර්ග බොහොමයකට ම කඩා වදින්නා වූ දේශීය සහ විදේශීය රහස් ඔත්තු බැලීම් අතිවිශාල ලෙස ඔබාමා විසින් පලල් කිරීම එම සාරධර්මවලට අනුකූල ය.

මෙම ක්‍රියාදාමය ම එක්සත් ජනපදය පුරා ප්‍රාදේශීය පොලිස් දෙපාර්මේන්තු තුල විසකුරු ලෙස ප්‍රකාශයට පත් වී ඇත. "නිජ භූමියේ ආරක්ෂාව" යන්න නව ප්‍රමිතිය බවට පත් ව ඇත. මීට අනුව "ජාතික ආරක්ෂාව" අන් සියල්ල යටපත් කරන්නා වූ සිද්ධාන්තය බවට පත් වී ඇති අතර සමස්ත ජනගහනය ම සතුරන් බවට පත් විය හැකි අය ලෙස සලකනු ලැබේ. කිසිදාක අවසන් නො වෙන "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ගැන කෙරෙන වංචාකාරී කතිකාව ඝාතනයන් දක්වා දිවෙන්නා වූ අන්තනෝමතික වූත් අධිප්‍රාමානික වූත් ප්‍රචන්ඩත්වය යුක්ති යුක්ත කිරීමේ කෝකටත් තෛලයක් බවට පත් වී තිබේ.

නිජභූමිය ආරක්ෂා කිරීමේ හටකාය, එෆ්බීඅයි ඔත්තු සේවය සහ අනෙක් ෆෙඩරල් ඒජන්සි සමග ප්‍රදේශීය පොලිස් හටයින් ඒකරාශී කර ගන්නා ඒකාබද්ධ ත්‍රස්තවාදී මර්දන හටකායන් නිර්මානය කිරීම තුලට මිලිටරි-පොලිස් මානසිකත්වය ගැබ් කරනු ලැබ ඇත. ඒ සමගම, දේශීය යුද්ධයක දී යොදා ගැනීමට සුදුසු වන්නා වූ මිලිටෙරිමය බලවේගයක් ගොඩනගමින්, ප්‍රහාරක රයිෆල්වල සිට යුද්ධායුධ සහිත වාහන දක්වා ඩොලර් බිලියන ගනන් වටිනා යුද්ධායුධ අවුරුදු පතා පෙන්ටගනයෙන් සපයනු ලැබේ.

මෙම වර්ධනයන්හි ඇත්ත වැදගත්කම පලමුවෙන් ම ප්‍රදර්ශනය කෙරුනේ 2013 අප්‍රේල් මස දී බොස්ටන් මැරතන් ධාවන තරගයේ දී කල බෝම්බ පිපිරවීමෙන් පසු ව බොස්ටන් නාගරික ප්‍රදේශය යුද්ධ නීතියට යට කිරීම තුල ය. සමස්ත ජනගහනය ම තම තමන් ගේ නිවාස තුල සිරකරුවන් බවට පත් කෙරුනු අතර ඔවුන් හෙල්මට් පැලඳි මැෂින් තුවක්කු අතින් ගත් යුද්ධ රථවල ආරක්ෂාව ලත් පොලිසිය විසින් වරෙන්තු නොමැතිව සෝදිසි කිරීමට ලක් කරන ලදී. මේ සියල්ල සිදු කරන ලද්දේ 19 හැවිරිදි එක් තරුනයෙක් අල්ලා ගැනීම සඳහා ය.

වඩාත් මෑතක දී පර්ගසන් නගරයේ දී පොලිස් මිනීමැරුමකට එරෙහි ව සාමකාමී විරෝධතාවකට මුහුන දෙනු ලැබුයේ ඇෆ්ගනිස්ථානයේ යුද්ධයට සැරසී සිටින්නාක් වැනි සූදානමක් පෙන්නුම් කල පොලිස් මෙහෙයවීමක් ද ඊට පසු ව එම නගරය පිහිටි මිසූරි නගරයේ පුරපති පූර්ව භංග ලෙස හදිසි නීතිය ප්‍රකාශ කිරීම සහ ඝාතක පොලිස් හටයාට එරෙහි නඩු පැවරීමට මහා ජූරිය අසමත් වීමට එරෙහිව තවදුරටත් විරෝධතා පුපුරන්නේ නම් ඊට එරෙහිව "ජාතික හටකාය" පාරට බැස්ස වීම මගින් ද සිදු විය.

මයිකල් බ්‍රවුන් හා එරික් ගාර්නර් ඝතනය කිරීම්වලට එරෙහි මෑත දී සිදු වූ විරෝධතාවල දී ජනාධිපති ඔබාමා ගේ සිට, කෝටිපති ක්‍රියාකාරී ඇල් ෂාර්ප්ටන් සහ ඩිමොක්‍රැටික් පක්ෂය වටා කැරකෙන සංවිධාන ජාලයක් ද අයත් වූ කන්ඩායමක් දැඩි ප්‍රයත්නයක් දැරුවේ, එක ම ප්‍රශ්නය වර්ගවාදය යැයි ද එයට පිලිතුරු දිය යුත්තේ වර්ගය ගැන කතිකාවක් මගින් යැයි ද නැතහොත් "නව සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයක්" මගින් හෝ නොයෙකුත් පොලිස් ප්‍රතිසංස්කරන වැනි වේදනා නාශක ප්‍රතිකර්මවලින් යැයි ද අවධාරනය කිරීමටය.

මේ සියල්ලේ අරමුන වන්නේ මහජන විරෝධය ආරක්ෂා සහිත මාර්ග දිගේ ගලා යෑමට සලස්වමින් ඊට වඩා බොහෝ භයානක වූ යථාර්තයක් සැඟවීම ය. එනම්, ඇමරිකානු මිලිටරි-රහස් ඔත්තු සේවා සංකීර්නය සමග සමීප සහයෝගයෙන් වැඩ කරන්නා වූ මිලිටරීකරනය කරන ලද පොලිසියක් සමස්ත කම්කරු පන්තිය ප්‍රචන්ඩකාරී ව මර්දනය කිරීම සඳහා සූදානම් කෙරෙනු ලැබේ. එය, වැඩවර්ජන, පෙලපාලි, විරෝධතා සහ සංගතමය සහ මූල්‍ය ප්‍රභූවට එරෙහි අනෙකුත් විරෝධතාවන්ට එරෙහිව යෙදවෙනු ඇත.

වධ දීම්, පොලිස් මිනීමැරුම් සහ මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් විනාශ කිරීම ආදී සියලු පියවර මූල්‍ය පරපුටුභාවය මගින් තම ධනය උපයා ගෙන ඇති අපරාධකාරී පාලක පන්තියක් විසින් පාවිච්චි කරන්නා වූ විධික්‍රම වෙයි. මෙම ප්‍රභූව තම ධනකන්දරාවන් ගොඩගසා ගෙන ඇත්තේ, විදේශ රටවල් තුල කොල්ලකෑම් පහසු කිරීම සඳහා මිලිටෙරි ප්‍රචන්ඩත්වය පාවිච්චි කරන අතර ජනගහනයේ අතිමහත් බහුතරය වන කම්කරු පන්තියෙන් ජනගහනයේ ඉහලින් ම සිටින සියයට 1 වෙත ට සමාජ ධනය මාරු කිරීම මගිනි.

මෙම පාලක තට්ටු ක්‍රියාත්මක වන්නේ තමා ගේ ක්‍රමයේ ශක්තිය ගැන පවතින හැඟීමක් හෝ ආත්ම විශ්වාසයක් සහිතව නොව සැබෑ බියකින් යුක්තව ය. ඔවුන් හොඳින් ම දන්නා දෙයක් වන්නේ සමාජ අසමානත්වය පිලිබඳ වාර්තා සහගත මට්ටම් ප්‍රජාතන්ත්‍රවාදය සමග එකට නො පවතින බව පමනක් නො ව ගෝලීය මූල්‍ය අර්බුදයේ ඊලඟ අනිවාර්ය පිපිරීම සමාජ කැරලි පුපුරා යෑමට තුඩු දෙන බවයි. වධකයින් හා පොලිස් ඝාතකයින්ට දඬුවම් ලැබීමෙන් නිදහස් වීමේ වරප්‍රසාදය හිමිවන්න් නම් එසේ වන්නේ කැරලිකාරී මහජනතාවට එරෙහිව ඔවුන් මුදා හැරීම සඳහා සැලසුම් කෙරෙන නිසා ය.

**බිල් වෑන් ඕකන්**

© www.wsws.org